# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2281/18 - 2022 මැයි මස 25 වැනි බදාදා - 2022.05.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : IR/COM/04/W/2016/04.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත 4(1) වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම**

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2018.08.17 වැනි දින අංක 2084/63 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2018.08.08 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශවයක් වශයෙන්;*
රත්නාවලී මල්ලිකා ද ජෝත් මිය ඇතුළු සේවකයින් 07 දෙනා
අංක. 45/2,
දළදාවත්ත පාර,
දකුණු තල්පිටිය,
වාද්දුව.

*සහ*

*අනෙක් පාර්ශවය වශයෙන් :*

ජාතික ඉතිරි කිරීමේ බැංකුව
අංක. 255,
ගාලු පාර,
කොළඹ - 03.

අතර පවත්නා 2018.08.02 වැනි දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන්/එල්. ආර්. සුමතිපාල මහතා වෙත යොමු කරන ලදී.

බේරුම්කරු එල්. ආර්. සුමතිපාල මහතා විසින් යොමුව සංශෝධනය කරන ලෙස කර ඇති දැනුම්දීම අනුව, යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින් කම්කරු අමාත්‍ය විදුර වික්‍රමනායක වන මා එම නියෝගය අවලංගු කරන අතර එකී 2018.08.08 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙසද මෙයින් නියෝග කරමි.

විදුර වික්‍රමනායක,
කම්කරු අමාත්‍ය.

2022 අප්‍රේල් මස 27 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය : IR/COM/04/W/2016/04.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන් :*

රත්නාවලී මල්ලිකා ද ජෝත් මිය ඇතුළු සේවකයින් 07 දෙනා
අංක. 45/2,
දළදාවත්ත පාර,
දකුණු තල්පිටිය,
වාද්දුව.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන් :*

ජාතික ඉතිරි කිරීමේ බැංකුව
අංක. 255,
ගාලු පාර,
කොළඹ - 03.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට
හේතුවී පවත්නා කරුණු වනුයේ

''1987.03.04 වැනි දින සිට iii ශ්‍රේණියේ iii පන්තියේ පිහිට වූ නිළධාරීන් 30 දෙනා අතුරින් ලේඛනයේ නම් සඳහන් නිළධාරීන් 07 දෙනා හට 1991.10.23 දිනැති හා අංක MF 2/1154/60/3 දරන මුදල් අමාත්‍යාංශ ලිපිය අනුව,

1. iii ශ්‍රේණියේ ii පන්තියට 1988.01.01 දිනට නොපිහිටු වීම.
2. iii ශ්‍රේණියේ i පන්තියට 1991.01.01 දිනට නොපිහිටු වීම.
3. ඒ එක් එක් ශ්‍රේණිවලට අදාළ වූ වැටුප් තලවල පියවරින් පියවර නොපිහිටුවීම.

මගින් එකී නිළධාරීන් හට අසාධාරණයක් සිදුව තිබේ ද? යන්නත්, එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔවුන්ට හිමිවිය යුතු සහන කවරේ ද? යන්නත් පිළිබඳව වේ.''

01. රත්නාවලී මල්ලිකා ද ජෝත් මිය
02. එච්. ඩී. එන්. ඩී. සිරිවර්ධන මිය
03. ජී. ටී. එම්. ඉන්ද්‍රානි තන්ත්‍රිගේ මිය
04. බී. එම්. කේ. කරුණාරත්න මිය
05. ජී. කේ. කේ. වීරසිංහ මිය

06. අයි. එල්. හේරත් මයා
07. ස්ටැන්ලි වීරසිංහ මයා

2022 අප්‍රේල් මස 04 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ,
කාර්යාලයේ දී දින යොදන ලදී.

බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,
කම්කරු කොමසාරිස් ජනරාල්.

මගේ අංකය : IR/COM/04/W/2016/04.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල් වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිලිබඳව,

*එක් පාර්ශවයක් වශයෙන්;*

රත්නාවලී මල්ලිකා ද ජෝත් මිය ඇතුළු සේවකයින් 07 දෙනා
අංක. 45/2,
දළදාවත්ත පාර,
දකුණු තල්පිටිය,
වාද්දුව.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන් :*

ජාතික ඉතිරි කිරීමේ බැංකුව
අංක. 255,
ගාලු පාර,
කොළඹ - 03.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය විදුර වික්‍රමනායක වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්.

කටුගස්තොට
යටිවැවල
මිගදාය, අරලිය උයන
අංක. 339/1/ඩී
නීතිඥ එල්. ආර්. සුමතිපාල මහතා

පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

විදුර වික්‍රමනායක,
කම්කරු අමාත්‍ය.

2022 අප්‍රේල් මස 27 වැනි දින,
කොළඹ දී ය.

EOG 5-0112

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.